**හොරණ නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) තොග අයිතම 07 ක වටිනාකම වූ රු.12,731 ක් අඩුවෙන් ශේෂ පත්‍රයෙහි දක්වා තිබුණි.

(ආ) වර්ෂය තුළදී මිලදී ගන්නා ලද වටිනාකම රු.94,965 ක් වූ වත්කම්, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.94,965 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් දැව භාවිතා කොට සකස් කරන ලද කාර්යාලයීය ලීබඩු හා උපකරණ ඒකක 47 ක වටිනාකම ගණනය කර ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් විෂයයන් 05 ක එකතු කළ අගය මත බදු වටිනාකම ස්ථාවර වත්කම් ගිණුමට ගිණුම් ගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය රු.124,204 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2015 වර්ෂය තුළදී සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම රු.5,938,125 ක් වූ වත්කම්, මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද පොත් සඳහා ලැබී තිබූ රු.254,734 ක වට්ටමක්, ලද වට්ටමක් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට දුන් වට්ටම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් පුස්තකාල පොත් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු.254,734 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ වියදම්ද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පුස්තකාල පොත් ඉවත් කිරීම් වටිනාකම වූ රු.11,099 ක් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට හර කළ යුතු වුවද සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි.

(ඌ) සාරාංශ ආදායම් ලේඛනය අනුව කර්මාන්ත ගිණුමට නොවැම්බර් මස ලදුපත් අංක 28608 යටතේ ලැබී තිබූ රු.953,418 ක වටිනාකම අදාල ප්‍රාග්ධන ලැබීම් ගිණුමට බැර කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සේවක ණය ලැබීම් රු.3,855 කින් වැඩියෙන් සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) සහනාධාර හා දායක වියදම් යටතේ (1-470) රු.7,200 ක් ගෙවිය යුතු වියදම් ලෙස වියදම් ගිණුමට ගලපා ඇතත්, ණයහිමි ගිණුම එම වටිනාකමින් බැර කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.370,719 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) පලාත් පාළන ආයතනවල ගිණුම් තැබීමේ පටිපාටියට අනුව ස්ථාවර වත්කම් ගිනුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදයමින් දායක වීමේ ගිනුමේ ශේෂය සමාන විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එම ගිණුම් දෙක අතර රු 330,584 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 **<u>නොසැසඳු ගිණුම්</u>**

(අ) කාර්යාල ලිපිද්‍රව්‍ය තොග පොත හා ගබඩා උපලේඛනය අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.12,731 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) විවිධ ණයහිමි ගිණුම, කඩකුලී හා පෙර ගෙවුම් ශේෂවල එකතුව මූල්‍ය ප්‍රකාශන අනුව රු. 58,482,351 ක්ද, උපලේඛන අනුව රු.45,819,822 ක්ද වූයෙන් රු.12,662,529 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

විස්තරාත්මක උපලේඛන හා ශේෂ තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.23,588,161 ක් වූ ගිණුම් ශේෂ 2 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **<u>නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>**

(අ) **<u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>**

(i) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වර්ෂ කිහිපයක සිට පැවත එන රු.1,040,049 ක් වූ තැන්පතු ශේෂයන් හඳුනාගෙන, නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට විගණිත දිනය වූ 2016 ජුනි 30 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1645(අ) (ඇ), හා 1646 ප්‍රකාරව දෛනිකව ධාවන සටහන් හා 268 පොදු ආකෘතියේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන්, ඊලඟ මාසයේ 15 දිනට පෙර, විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ධාවන සටහන් හා මාසික සාරාංශ එලෙස විගණනයට ඉදිරිපත් වී නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 756, 757 හා මුදල් රෙගුලාසි 1647(අ) ප්‍රකාරව වාහනයේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර නිලධාරියෙකුගෙන් තවත් නිලධාරියෙකුට වාහනයේ ආරක්ෂාව භාර දෙනු ලබන අවස්ථාවේදී සමීක්ෂණයක් කළ යුතු වුවද, සභාවේ වාහන සම්බන්ධයෙන් එවැනි සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.16,034,684 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.16,172,065 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.9,537,659 ක් වූ හිඟ ආදායම් නගර සභා ආඥා පනතේ (255) අධිකාරියේ 160, 165, 170 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 වරිපනම් බදු

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය වූ රු.11,397,487 කින් 2015 දෙසැම්බර් 31 දින වනවිට රු.8,890,760 ක් අයකරගෙන තිබූ අතර තවදුරටත් පැවති රු.2,506,727 ක් වූ හිඟය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. 2015 වර්ෂයට අදාලව රු.14,775,674 ක් බිල් කිරීම සිදු කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එයින් රු 2,303, 646 ක් අය විය යුතුව තිබුණි.

#### 2.2.3 කර්මාන්ත හා ව්‍යාපාර බදු

2014 වර්ෂයට හා ඊට පෙර වර්ෂයන්ට අදාලව හිඟ කර්මාන්ත බදු රු.23,500 ක්ද, හිඟ ව්‍යාපාර බදු රු.6,000 ක්ද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබූ අතර 2015 වර්ෂයට අදාල රු.15,000 ක් වූ හිඟ ව්‍යාපාර බදු ශේෂයද විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 31 වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.4 නිවාස කුලී

2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.6,455 ක් වූ හිඟ නිවාස කුලී ශේෂය 2015 දෙසැම්බර් 31 දින දක්වාද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 කඩ බදු

රාජ්‍ය ආයතනයක් වෙත බදු දී තිබූ කඩකාමර අංක 37 හා 38 2014 සැප්තැම්බර් 24 දින සිට බදු අයිතියෙන් ඉවත් වී ඇති නමුත් හිඟ කුලිය වන රු.6,000 ක මුදල 2015 ජුලි 31 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.6 දැන්වීම් පුවරු ආදායම්

(අ) 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් ඩිජිටල් පුවරු දැන්වීම් හා නාම පුවරු ගාස්තු ලෙස රු.4,025,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.513,990 ක් පමණක් අයකරගෙන තිබූ අතර රු.3,511,010 ක් අය විය යුතුව තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ 2014 නොවැම්බර් 14 දිනැති ගැසට් නිවේදනයේ 11-378/3 ඡේදයේ දක්වා ඇති පරිදි හොරණ නගර සභා සීමාවේ ප්‍රචාරක දැන්වීම්, බැනර්, දැන්වීම් පුවරු, ඩිජිටල් පුවරු ප්‍රදර්ශණය සඳහා එහි දක්වා ඇති ගාස්තු අයකළ යුතු වුවද 2016 පෙබරවාරි 23 දින හොරණ-පානදුර මාර්ගය අවට පමණක් සිදු කළ නියැදි භෞතික පරීක්ෂාවේදී ගාස්තු අය නොකළ ස්ථාවර දැන්වීම් පුවරු 23 ක් විගණනයට නිරීක්ෂණය වූ අතර ඒ තුළින් සමාලෝචිත වර්ෂය සඳහා පමණක් සභාවට නොලැබී ගොස් තිබූ ආදායම රු.203,200 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාහන පාලනය

(අ) 2012 වර්ෂයේදී අනතුරකට ලක් වී තිබූ ජල බවුසරය අළුත්වැඩියා කිරිම සඳහා 2014 හා 2015 වර්ෂවලදී ස.තො.ස. මෝටර්ස් හා ෆයිබර් ග්ලාස් ආයතන වෙත රු.1,416,788 ක් ගෙවීමට සභාවට සිදු වී තිබූ නමුත් මෙම අනතුර සම්බන්ධයෙන් රක්ෂන වන්දි ලෙස රක්ෂණ සංස්ථාවෙන් ලැබී තිබුණේ රු.929,321 ක් පමණි. සභාව විසින් වාහනයේ තක්සේරු මුදලට වඩා අඩුවෙන් මෙම වාහනය රක්ෂණය කර තිබීම එයට හේතු වී තිබුණි. ඒ අනුව රක්ෂණ වන්දි ඉක්මවා රු.487,467 ක් සභාව වැය කර තිබුණි.

(ආ) එසේම මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කොට පරීක්ෂණ පවත්වා අලාභ හානි සම්බන්ධව වග කිව යුත්තන් නිශ්චයකොට හානියේ වටිනාකම අදාල වග කිව යුත්තන්ගෙන් අයකරගැනීමට විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 01 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ වාහනවලින් පරිහරණයෙන් ඉවත් කළ ටයර් හා ටියුබ් විශාල ප්‍රමාණයක් ගබඩා ඉඩකඩ අවුරාලමින් නිකරුණේ ගොඩ ගසා පැවතින. ටයර් නැවත පිරවීමෙන් පසු ප්‍රයෝජනයට ගැනීමට හෝ විකුණා දැමීමට විගණන දිනය වූ 2015 සැප්තැම්බර් 01 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) 2014 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලට අනුව ගබඩා භාරකරු සතුව තිබූ මූල්‍ය වටිනාකමක් ඇති වෙළඳ මඩු හා බිම් සඳහා වූ පරිහරණ බලපත්‍ර -B ආකෘතිය උපපත්‍රිකාපත් 25000 ක ඌනතාවයක් දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණ

(ආ) සභා අරමුදල් රෑ 87,000 ක් වැය කර සභාව මගින් සභාපතිවරයා හා නාගරික මන්ත්‍රීවරුන් සඳහා ලබා දී තිබූ ජංගම දුරකථන 06 සහ පාකිස්ථාන් වර්ගයේ අහල් 3 Gl බට 1 ක් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු ආපසු සභාවට භාරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ පුස්තකාල 03 කින් බාහිර පාඨකයින් විසින් බැහැර ගෙන ගොස් ආපසු භාර නොදුන් රු.7,537 ක් වූ පොත් 34 ක වටිනාකම ආපසු අයකරගැනීමට හෝ එම පොත් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 පෙබරවාරි 24 දිනැති විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/2011 දරන චක්‍රලේඛයේ 4.1 වගන්තියට අනුව අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලේකම් හා ගණකාධිකාරි වෙත එවීමට කටයුතු කළ යුතු වුවත් එසේ නොකොට සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රමාද වී ප්‍රේෂණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.51,234 ක් අදාල අරමුදල වෙත දඩ මුදල් වශයෙන් ගෙවා තිබුණි.

(ඉ) 2015 අයවැය ඇස්තමේන්තුව මගින් වර්ෂය තුළ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරිම සඳහා රු.2,500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) 2014 වර්ෂයේ වියදම් ණයහිමියන් ලෙස වෙන් කර තිබූ රු.150,198 ක වටිනාකමක් ඇති ණයහිමියන් 2016 අප්‍රේල් 11 දින වන විටත් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

බලය නොලත් ගනුදෙනු

3.3 නගර සභා ආඥා පනතේ 159(ඊ) වගන්තිය අනුව යම් වර්ෂයක මුළු එකතුව රුපියල් පන්දහසකට වැඩි වන යම් ආගමික, පුණ්‍යාධාර, සංස්කෘතික, සෞඛ්‍ය, විනොදාත්මක හෝ අධ්‍යයන සිද්ධීන් සම්බන්ධයෙන්ද, (උ) වගන්තිය අනුව යම් වර්ෂයකට මුළු එකතුව රුපියල් දෙදහස් පන්සියයකට වැඩි වන ලෙස සභාව විසින් වෙන් කරනු ලබන දායක මුදල් හා පොදු උත්සව සහ විනෝද කටයුතු, යම් පුස්තකාල සඳහා ආධාර හෝ අධ්‍යාපනික, විනෝදාත්මක, පුණ්‍යාධාර සහ යහසාධක ආයතන හෝ යම් ආගමික කටයුතුවල පිරිවැය සඳහා අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.76,982 ක වියදමක් වෙසක් උත්සවය සඳහාද රු.210,000 ක් පරිත්‍යාග ලෙසද ලබාදී තිබුණි.

3.4 **සණ අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක කසල කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා 2014 හා 2015 වර්ෂවලදී රු.496,144 ක වියදම් දරා උපකරණ මිලදී ගෙන තිබූ නමුත් සභාව තුළ කිසිදු කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. සභා බල ප්‍රදේශය තුළ එක් රැස්වන නොදිරන කුණුකසල බැහැර කිරීම සඳහා 2015 අගෝස්තු 10 දින වන විට මොරටුව මහ නගර සභාවට මාස 04 ක් වෙනුවෙන් රු.214,971 ක් හා පෞද්ගලික ආයතනයකට මාස 2 ½ ක් වෙනුවෙන් රු.563,750 ක් ගෙවා තිබුණි. නාගරික බල ප්‍රදේශයෙන් පිටත ජනගහනය අඩු ප්‍රදේශ වැඩියෙන් පවතින (සභා බල ප්‍රදේශයෙන් බාහිරව වුවද) මෙම සභාව සඳහා කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ හැකිව තිබුණි.

(ආ) එසේම 2014 වර්ෂයේ මිලදී ගෙනතිබූ කොම්පෝස්ට් බඳුන් 80 න් විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 01 දින වන විටත් ආදල කාර්යය සඳහා නිකුත් කර තිබුණේ බඳුන් 05 ක් පමණක් වන අතර ඉතිරි බඳුන් 76 ම කිසිදු භාවිතයකින් තොරව සභාවේ පැවතුණි. මීට අමතරව විගණනය වෙත ලබා දුන් තොරතුරුවලට අනුව කසල කළමනාකරණය සඳහා 2013 වර්ෂයේදී සභාවට ලැබී තිබූ ලීටර් 11 ප්ලාස්ටික් බඳුන් 1200 බාහිර පාර්ශවයන්ට නිකුත් කිරීම සඳහා ගබඩාවෙන් සෞඛ්‍ය අංශයට ලබා දී තිබුණේ 2015 අගෝස්තු 20 දින වන අතර විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 01 වන විටත් ඉන් බඳුන් 396 ක් සෞඛ්‍ය අංශයේ ඉතිරිව පැවතුණි.

## 3.5 <u>කොන්ත්‍රාත් පාලනය</u>

### (අ) <u>රෝයල් ගාඩ්න් බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ඉදිකිරීම- පිරිවැය රු.650,000</u>

මෙම කර්මාන්තය සඳහා වූ ඇස්තමේන්තුවේ අයිතම අංක (12) යටතේ වූ වැඩ විස්තරයට අනුව ජලය බැස්සවීම සඳහා 2′x2′x2′ ප්‍රමාණයේ ගලි යෙදිය යුතු වුවත් ඒ සඳහා යෙදා තිබුණේ අඩි 1 විෂ්කම්භය සහිත 6₺ ප්‍රමාණයේ ගැඹුර සහිත වෘත්තාකාර ස්වරූපයේ ගලි බැවින් ඒවා ඇස්තමේන්තු වැඩ විස්තරයට අනුකූල නොවීය.

### (ආ) <u>මහජන ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අළුත්වැඩියා කිරීම</u>

<u>ඇස්තමේන්තු මුදල රු.12,790,000</u>

(i) මූලික ඇස්තමේන්තු අනුව විවේක කාමර 02 ක් ඉදි කිරීමට සැලසුම් කර තිබුණද එය (කාමර අංක 06) නාන කාමර දෙකක් ලෙස නිම කර තිබූ අතර එකී නාන කාමර දෙකෙහි මුල් ඇස්තමේන්තුවට අනුව වූ සිවිලිං විදුලි පංකාද සවි කර තිබුණි. මෙම කාමරවල අවසන් මිණුම් ගැනීම විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 01 වන විටත් සිදු කර නොතිබුණි. තවද, ඇස්තමේන්තුවේ වැඩ අයිතම වෙනස් කිරීමට අදාලව මූලික ඇස්තමේන්තුව සංශෝධනය කර නොතිබුණි.

(ii) ක්‍රීඩාගාරයේ වහලය සකසා තිබූ යකඩ සැකිලි (roof trusses) සහ යකඩ පරාලවල බොහොමයක් කොටස් සඳහා මල නොබැඳෙන තීන්ත ආලේපනයක් යොදා නොතිබුණු අතර දැඩි ලෙස මල බැඳීම සිදු වෙමින් පැවතුණි.

(iii) ක්‍රීඩාගාරයේ වහල ඉතා උස්ව පැවතීම හේතුවෙන් ක්‍රීඩාගාරයේ ඉදිරිපසින් හා දෙපසින් වැසි ජලය ක්‍රීඩාගාරය තුළට පතිත වන බැව් නිරීක්ෂණය විය.

### (ඇ) <u>ක්‍රීඩාගාරයේ ඉදිරිපස දොරවල් සවිකිරීම</u>

<u>ඇස්තමේන්තු මුදල රු.325,000</u>

(i) ඇලුමිනියම් රෝලර් ෂටර්ස් දොරවල් වසා දැමූ පසුත් වැසි ජලය ක්‍රීඩාගාරය තුළට කාන්දුවීම සිදු වී තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය ගල්ඒදඬුගොඩ ප්‍රජා මණ්ඩලය වෙත ලබාදී තිබූ නමුත් මේ සඳහා වූ තාක්ෂණික දැනුම එම සමිතිය සතු නොවන බවත් එම තාක්ෂණික දැනුම වෙනත් පෞද්ගලික ආයතනයක් වෙතින් ලබාගන්නා බවත් එම සමිතිය විසින් දැනුම් දී තිබුණි.

(ඈ) **<u>මහජන ක්‍රීඩාංගන භූමියේ පිටුපස කම්බිවැට ගැසීම</u>**

**<u>ඇස්තමේන්තු මුදල රු.250,000</u>**

ක්‍රීඩා පිටිය ආවරණය වන ලෙසට පහත සඳහන් ප්‍රමාණවලින් කම්බි වැට සකස් කිරීමට රු.325,000 ක මුදලකට ඇස්තමේන්තුව සකස් කර තිබුණද සත්‍ය වශයෙන් ඉටු කර තිබුණේ පහත පරිදි ඇස්තමේන්තුවෙන් සියයට 30 ක පමණ ප්‍රමාණයක් පමණි. මේ සඳහා හේතු වූ කරුණු විගණනයට අනාවරණය නොවීය.

| අයිතම අංකය | අයිතමය | ඇස්තමේන්තුගත ඒකකය | ප්‍රමාණය (Qty.) | සත්‍ය වශයෙන් ඉටු කළ ප්‍රමාණය (Qty.) |
|---|---|---|---|---|
| ------- | ----------- | -------------------- | ---------- | ----------------------- |
| 2 | කටුකම්බි වැට | අඩි | 5960 | 1901 |
| 3 | පෙර සැකසූ කොන්ක්‍රීට් කණු | සංඛ්‍යාව | 106 | 34 |

මෙලෙස කම්බි වැට අවශ්‍යව තිබූ සම්පූර්ණ ප්‍රදේශය ආවරණය වන සේ වැට ඉදි නොකර කොටසක් සඳහා පමණක් කම්බි වැට ඉදිකිරීම නිසා කම්බි වැට ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබූ අතර පුළුල් පරාසයක ප්‍රදේශයක් කම්බි වැට රහිතව අනාරක්ෂිතව තිබූ බව 2015 අගෝස්තු 31 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(i) ක්‍රීඩාංගණ භූමියේ දකුණු පස (වැට ඉදි කළ ප්‍රදේශය) සම්පූර්ණයෙන්ම පාහේ ජලය පිරීම නිසා වගුරු බිමක් බවට පත්වී තිබුණි. ක්‍රීඩා පිටිය දකුණු පස දැඩි ලෙස වල් බිහිවී තිබූ අතර එම ප්‍රදේශයේ බොහෝ ස්ථානවලට ගමන් කළ නොහැකි විය.

(ii) සවිකර තිබූ කොන්ක්‍රීට් කණු කීපයක් ඇතැම් ස්ථානවලින් කැඩී ගොස් තිබූ අතර කම්බි ඇතැම් ස්ථානවලින් පිටතට නෙරා ඇති බව නිරීක්ෂණය විය.

3.6 **<u>නිශ්ක්‍රීය වත්කම්</u>**

1993 නොවැම්බර් 18 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ අංක 15 දරන සැලසුම් චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව අංක 719675 දරන නාගරික සංවර්ධන අධිකාරී ගිණුමේ මුදල් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යොදා ගත හැකි ආකාරය දක්වා තිබුණද ඉහත ගිණුමේ 2006 වර්ෂයේ සිට පැවත එන රු.99,885 ක් වූ ශේෂය එවැනි කාර්යයකට යොදා නොගෙන 2016 ජුනි 13 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

3.7 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත තනතුරු 5 ක පුරප්පාඩු 27 ක් හා තනතුරු 09 ක, 38 ක අතිරික්තයක්, පවතින බව නිරීක්ෂණය විය.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය